නිවේදනය 01

**සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.**

**සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු (අ.පො.ස. (උ.පෙළ)) සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම - 2023.**

සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල පවතින, උපලේඛන අංක I යටතේ දක්වා ඇති විෂය ක්ෂේත්‍රයන්ට **(අ.පො.ස. (උසස් පෙළ) හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ වන විෂයන් සඳහා)** අදාළ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු පාසල් පාදකව සම්පූර්ණ කිරීම සඳහා අංක 23/1139/607/096 හා 2023.07.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/02/29/21/AL/02-vi වෙළුම හා 2023.07.24 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව, මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති සබරගමුව පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**වැදගත් :- දෙමළ මාධ්‍ය පුරප්පාඩු සඳහා සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් සබරගමුව පළාත තුළින් තෝරා ගැනීමට නොහැකි වුවහොත් පමණක්, සබරගමුව පළාතේ අවම වශයෙන් වසර 08ක් සේවය කිරීමට යටත්ව දීපව්‍යාප්ත මට්ටමින් අයදුම්පත් ඉදිරිපත් කරනු අයදුම්කරුවන් සම්බන්ධයෙන් සළකා බලනු ඇත. එබැවින් දෙමළ මාධ්‍ය පුරප්පාඩු සඳහා පමණක් දීපව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.**

**1). සාමාන්‍ය සුදුසුකම් :-**

i. අයදුම්කරු / අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ii. විශිෂ්ට චරිතයකින් සහ මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

iii. 2023.11.13 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබිය යුතු අතර, එදිනට වයස අවුරුදු 35 නොඉක්මවිය යුතු ය.

iv. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට එනම් 2023.11.13 දිනට පූර්වාසන්න, සබරගමුව පළාතේ වසර 03ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. (සම්මුඛ පරීක්ෂණයේදී තම ස්ථිර පදිංචිය ග්‍රාම සේවා සහතික හෝ අදාළ වෙනත් ලියවිලි මගින් සනාථ කළ යුතු වේ.) එසේම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර විවාහ වී වෙනත් පළාතක සිට මෙම පළාතට පැමිණි අපේක්ෂකයින් වෙතොත් ඔවුන් සිය විවාහ සහතිකය සහ කලත්‍රයාගේ ස්ථිර පදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතු ය.
**සැලකිය යුතු යි :- දෙමළ මාධ්‍ය පුරප්පාඩු සඳහා දීපව්‍යාප්ත පදනමින් අයදුම් කරනු ලබන වෙනත් පළාත්වල අයදුම්කරුවන්හට පමණක් මෙම කොන්දේසිය අදාළ නොවේ.**

v. මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**2). අධ්‍යාපන සුදුසුකම් :-**

i. 2023.11.13 දිනට ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂ කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් (දේශීය / විදේශීය) විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපාධියක් ලබා තිබිය යුතු අතර, එම උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයන්වලට අනුකූලව එක් එක් පුරප්පාඩු විෂය සඳහා මෙම නිවේදනයේ උපලේඛන අංක Iහි සඳහන් සුදුසුකම් සපුරා තිබීම අනිවාර්යය වේ.

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එක්වරකදී විෂයයන් 03ක් (සාමාන්‍ය ඉංග්‍රීසි හා පොදු පරීක්ෂණය හැර) සමත්වීම.

iii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී මව්බස හා ගණිතය සමත්ව, සම්මාන 03ක් සහිතව විෂයන් 06 කින් සමත්වීම.

**ඉතා වැදගත් :- ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතු ය.**

- ❖ ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයන් පිළිබඳව අයදුම්කරුවන් අවධානය යොමු කළ යුතු ය.
- ❖ උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂය / විෂයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතු ය. ඒ අනුව අයදුම් කරනු ලබන සෑම උපාධිධාරියෙකුම අංක 17/1597/742/027 හා 2017.08.29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඉගැන්වීමට නියමිත විෂය, උපාධියට හදාරනු ලැබූ මුළු විෂය සංධාරයෙන් තුනෙන් එකක් (1/3) සම්පූර්ණ කළ අයවලුන් විය යුතු ය.
- ❖ උපාධියේ විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයෙහි විෂය සංධාරය සඳහන් නොවේ නම් එය අදාළ විශ්වවිද්‍යාලය මගින් තහවුරු කර එම ලේඛන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු ය.
- ❖ උපාධියෙහි විෂය සංධාරය සම්බන්ධයෙන් ඇතිවන ගැටලු සම්බන්ධයෙන් අවසන් තීරණය සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.
- ❖ ඉල්ලුම් කළ හැක්කේ විෂයන් දෙකක් (02) සඳහා පමණි.
- ❖ ඉල්ලුම් කළ විෂය / විෂයන් කිසිදු හේතුවක් වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**3). <u>බඳවා ගැනීමේ ක්‍රමය :-</u>**

3:1. පාසල් පාදක ක්‍රමය යටතේ උපලේඛන අංක Iහි දක්වා ඇති විෂය ක්ෂේත්‍රයන්ට අදාළව පමණක් විෂයානුබද්ධව මෙම බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

3:2. එක් එක් විෂය සඳහා ලැබී ඇති සුදුසුකම් සහිත අයදුම්පත් සංඛ්‍යාව මත විවෘත තරඟ විභාගයක් පවත්වා සුදුසුස්සන් තෝරා ගන්නේද, නැතහොත් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීම මගින් පමණක් සුදුසුස්සන් තෝරා ගන්නේද යන්න සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණය කරනු ලැබේ.

3:3. එක් එක් විෂය සඳහා ලැබී ඇති සුදුසුකම් සහිත අයදුම්පත් සංඛ්‍යාව මත තරඟ විභාගය නොපවත්වන අවස්ථාවක දී, සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට අයදුම්කරුවන් භාජනය කරනු ලැබේ. එම ප්‍රායෝගික පරීක්ෂණයේදී ඔවුන් ලබා ගන්නා ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාව මත පවතින ගුරු පුරප්පාඩු සඳහා පාසල් පාදකව පත්වීම් ලබා දීමට සුදුස්සන් තෝරාගනු ලැබේ.

3:4. එක් එක් විෂය සඳහා ලැබී ඇති සුදුසුකම් සහිත අයදුම්පත් සංඛ්‍යාව මත තරඟ විභාගය පවත්වන අවස්ථාවක දී, මෙම නිවේදනයේ අංක 1. හා 2.හි සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන පරිදි විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ බලය පවරනු ලබන වෙනත් ආයතනයක් විසින් සුදුස්සන් තෝරා ගැනීම සඳහා ලිඛිත තරඟ විභාගයක් පවත්වනු ලැබේ. එම ලිඛිත තරඟ විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාව අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 1.25 ගුණයක අයදුම්කරුවන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ඇත. එම සම්මුඛ පරීක්ෂණයේදී සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයේදී ඔවුන් ලබා ගන්නා ලද ලකුණුවල හා ලිඛිත තරඟ විභාගයේදී ලබා ගන්නා ලද ලකුණුවල මුළු එකතුවේ ප්‍රමුඛතාව අනුව පවතින ගුරු පුරප්පාඩු සඳහා පාසල් පාදකව පත්වීම් ලබා දීමට සුදුස්සන් තෝරාගනු ලැබේ.

3:5. **<u>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-</u>** ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීමට සහ කායික හා මානසික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදුකරනු නො ලැබේ.

3:6. **ප්‍රායෝගික පරීක්ෂණය :-** ගුරු වෘත්තියේදී වැදගත් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාව මැන බැලීම සඳහා පවත්වනු ලැබේ. අයදුම්කරුවන් විසින් පත්වීම් ලබා ගැනීමට අපේක්ෂා කරන විෂයයට අදාළව හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ විනාඩි 05කට නොඅඩු ඉදිරිපත් කිරීමක් ප්‍රායෝගික පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු ය. ප්‍රායෝගික පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක ඔස්සේ ලකුණු ලබා දෙනු ඇත.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | අරමුණ හා ප්‍රවිෂ්ට වීම. | 05 | 02 |
| 2. | පෞරුෂය හා හඬ පාලනය. | 05 | 02 |
| 3. | සන්නිවේදනයේ පැහැදිලි බව. | 05 | 02 |
| 4. | කාල කළමනාකරණය. | 05 | 02 |
| 5. | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය. | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය. | 25 | 10 |

3:7. ඒ අනුව, සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල පවතින, මෙම නිවේදනයේ අවසානයට දක්වා ඇති උප ලේඛන අංක Iහි සඳහන් පුරප්පාඩු විෂයන් සඳහා පමණක් පාසල් පාදකව මෙම බඳවා ගැනීම් සිදුකරනු ඇත. ඊට අදාළ පාසල් පුරප්පාඩු ලේඛනය සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට පෙර ප්‍රසිද්ධ කරනු ලබන හෝ සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ප්‍රදර්ශනය කරනු ඇත. එකී පුරප්පාඩු ලේඛනය මත පමණක් පදනම්ව පත්වීම් ලබා දෙනු ලැබේ. විදුහල්පතිවරුන් විසින් අපේක්ෂකයන් වෙත පෞද්ගලිකව නිකුත් කරනු ලබන පුරප්පාඩු ලිපි ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3:8. එසේ ප්‍රසිද්ධ කරනු ලබන පාසල් පුරප්පාඩු ලේඛනය අනුව, අයදුම්කරුවන් විසින් පුරප්පාඩු පවතින පාසල් සඳහා පත්වීම් ලබාගැනීමට ඇති ස්වකීය මනාපය අනුපිළිවෙලින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී දැක්විය යුතුය.

3:9. පත්වීම් ලබාදීම සිදුකරනු ලබන්නේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව, තරඟ විභාගයේදී ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාව හා / හෝ ප්‍රායෝගික පරීක්ෂණයේදී ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාව අනුව වන අතර, පාසල් සඳහා මනාප ලකුණු කිරීම පත්වීමක් ලබා ගැනීම සඳහා වන සුදුසුකමක් සේ සලකනු නොලැබේ.

3:10. පවතින විෂයානුබද්ධ ගුරු පුරප්පාඩු සඳහා පාසල් පාදකව පත්වීම් ලබා දීමට සුදුස්සන් තෝරා ගැනීමේදී එක් පුරප්පාඩුවක් සඳහා අයදුම්කරුවන් කිහිපදෙනෙකු මනාපය පළ කරන ලද අවස්ථාවක් වෙතොත්, එහිදී එම අයදුම්කරුවන් තරඟ විභාගයේදී ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාව හා / හෝ ප්‍රායෝගික පරීක්ෂණයේදී ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාව සලකා බලනු ලැබේ. එක් පුරප්පාඩුවක් සඳහා මනාපය පළ කරන ලද අයදුම්කරුවන් කිහිපදෙනෙකු සමාන ලකුණු ලබා ඇති අවස්ථාවකදී අදාළ පාසලට ඇති ආසන්නතාවයට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ. එම නිර්ණායක මත සුදුසුකම් ලබන අයදුම්කරුවන් බඳවා ගැනීම සිදුකරනු ඇත.

3:11. ප්‍රසිද්ධ කරනු ලබන පාසල් පුරප්පාඩු ලේඛනයේ සඳහන් කිසියම් අත්‍යවශ්‍ය පුරප්පාඩුවක් සම්පූර්ණ කළ නොහැකි අවස්ථාවකදී, බඳවා ගැනීමේ කොන්දේසි සපුරන ලද සෙසු අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ඇත. එහිදී අයදුම්කරු අදාල පුරප්පාඩුව පවතින පාසල සඳහා ඉල්ලුම්කර නොමැති වුවද, බඳවා ගැනීමේ කොන්දේසි නොඉක්මවන පරිදි ලබා ඇති ලකුණුවල ප්‍රමුඛතාවය මත බඳවා ගනු ලැබේ. කෙසේ වෙතත් මේ යටතට ගැනෙන පාසල් පුරප්පාඩු තෝරා ගැනීම සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අභිමතය පරිදි වේ.

3:12. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි විධිවිධාන අනුව, පත්වීම් ලබා දීමේදී පවත්නා පුරප්පාඩු ප්‍රමාණයෙන් 3%ක් විශේෂ අවශ්‍යතා ඇති අය සඳහා (ආබාධිත) වෙන් කරනු ලැබේ. පත්වීම් සඳහා තෝරාගනු ලබන අවස්ථාවේදී අදාළ තනතුරේ සේවය කිරීමට තම විශේෂ අවශ්‍යතා තත්වය (ආබාධිත තත්වය) බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ කළ යුතු ය. කෙසේ වෙතත් විශේෂ අවශ්‍යතා ඇති අපේක්ෂකයෙකු පත්වීම් ලබාගැනීම සඳහා සුදුසුකම් ලැබීමට නම් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ වලින් නියමිත ලකුණු ප්‍රමාණයන් ලබා තිබිය යුතු වේ.

3:13. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් එකක් හෝ කිහිපයක් හෝ සපුරා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාරගනු නොලැබේ.

**4). සේවා කොන්දේසි :-**

4:1. රජයේ / පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව තෝරා ගනු ලබන උපාධිධාරීන් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I(අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

4:2. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට පත්වීම්ලාභීන් යටත් විය යුතු ය.

4:3. මෙම තනතුරට පත්කරනු ලබන්නන් වසර 03ක පරිවාස කාලයකට යටත් වේ.

4:4. 2014.10.23 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.4හි සඳහන් විධිවිධාන අනුව බඳවා ගැනීම් සිදුකරනු ලබන අතර, උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව සිදුකරනු ඇත. එමෙන්ම මෙම පුවත්පත් නිවේදනයෙන් ආවරණය නොවන්නාවූ යම් කරුණක් වෙතොත් එම අවස්ථා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

4:5. සෑම පත්වීම්ලාභියෙකුම 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020හි සඳහන් විධිවිධාන අනුව හා එයට වරින් වර සිදුකරනු ලබන සංශෝධනයන්ට අනුව දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

4:6. මෙම බඳවා ගැනීම් පාසල් පාදකව සිදුකෙරෙන බැවින් සෑම අයෙකුම මුල් පත්වීම ලබන පාසලේ අවම වශයෙන් අඛණ්ඩව වසර 08ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු අතර, එම කාල සීමාව තුළදී ස්ථාන මාරු හිමිකම් නොලැබේ.

**5). වැටුප් පරිමාණය :-**

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016(iv) අනුව වන අතර, මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය ජීඊ-1-2016-ඒ දරන වැටුප් ඛණ්ඩය යටතේ මාසිකව **රු.31,490-6x445-7x525-2x600-රු.39,035/=** ක් වේ. උපාධිධාරීන් මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රු 37,835/- මාසික වැටුප පිහිටවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාවන් ද හිමි ය.

**6). අයදුම්පත පිරවීම සඳහා උපදෙස් :-**

6:1. එක් අයදුම්කරුවෙකුහට සිය අධ්‍යාපන සුදුසුකම් මත හා මනාපය මත පුරප්පාඩු විෂයන් 02ක් සඳහා පමණක් ඉල්ලුම් කිරීමට හැකියාව ඇත. පත්වීම් ලබා දීමේදී පුරප්පාඩු සඳහා ඉල්ලුම් කර ඇති අනුපිළිවෙල සැලකිල්ලට ගනු ලැබේ.

6:2. සෑම අයදුම්කරුවෙකුම සිය අයදුම්පත සමග තමා විසින්ම සහතික කරන ලද පහත ලේඛන අමුණා තිබීම අනිවාර්යය වේ.

i. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද අ.පො.ස.(සා.පෙළ) හා අපො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනවල පිටපත්,
ii. උපාධි සහතිකයේ (Degree Certificate) පිටපතක්,
iii. මූලික උපාධියට අදාළ සවිස්තරාත්මක සහතිකයේ (Detail Certificate / Academic Transcript) පිටපතක් (උපාධි පාඨමාලාවට අදාළව හදාරා ඇති විෂය සංකලනය සනාථ කර ගැනීම සඳහා),
iv. ජාතික හැඳුනුම්පතේ පිටපතක්,

v. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට එනම් 2023.11.13 දිනට පූර්වාසන්න, සබරගමුව පළාතේ වසර 03ක ස්ථිර පදිංචිකරුවෙකු බව සනාථ කෙරෙන ග්‍රාම නිලධාරී සහතිකය. (අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර විවාහ වී වෙනත් පළාතක සිට මෙම පළාතට පැමිණි අපේක්ෂකයින් වෙතොත් ඔවුන් සිය විවාහ සහතිකයේ පිටපතක් සහ කලත්‍රයාගේ ස්ථිර පදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතු ය).
**සැලකිය යුතු යි :- දීපව්‍යාප්ත පදනමින් අයදුම්පත් කැඳවා ඇති දෙමළ මාධ්‍ය පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරනු ලබන වෙනත් පළාත්වල ස්ථිර පදිංචි අයදුම්කරුවන් තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.**

6:3. අයදුම්පත සම්පූර්ණ කිරීමේදී උපලේඛන අංක I භාවිතා කරන්න. කාර්යාලීය ප්‍රයෝජනය සඳහා අදාළ කොටුව සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අවශ්‍යතාව සඳහා හිස්ව තබන්න.

6:4. දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පත්‍රයේ අංක 13. ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

6:5. දෘශ්‍යාබාධිත, ශ්‍රවණාබාධිත හෝ වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් තම ආබාධිත තත්වය අයදුම්පත්‍රයේ වම් පස ඉහළ කෙළවරේ රතු පැහැයෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

**7). <u>ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-</u>**

7:1. A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපිටම භාවිත කරමින් මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත් සකස් කරගත යුතු ය. අයදුම්පත්‍රයේ 01 සිට 8:6 තෙක් ඡේද මුල් පිටුවේත් ඉතිරිය දෙවන පිටුවේත් සඳහන් විය යුතු ය. අදාළ ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා සෑම ආකාරයෙන්ම අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ජායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය). ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය නිවේදනයේ දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලවම ඉදිරිපත් කිරීම අපේක්ෂකයාගේ වගකීමකි. එමෙන්ම අයදුම්පත්‍රය සකස් කර ගැනීමේදී එහි ශීර්ෂයේ සඳහන් නම, සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

7:2. එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පත් ලැබී ඇති බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ. තැපෑලේදී නැති වන හෝ ප්‍රමාද වන හෝ අයදුම් පත් ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ. ඉල්ලුම් කරන ලද විෂය පසු අවස්ථාවක දී කිසිසේත් වෙනස් කරනු නොලබන අතර, ඒ පිළිබඳව ඉදිරිපත් කරන අභියාචනා සලකා බලනු නොලැබේ. තවද, උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂය / විෂයන් යටතේ උපලේඛන අංක Iහි සඳහන් සුදුසුකම් අනුව පමණක් ඉල්ලුම් කළ යුතු අතර, පත්කරනු ලබන පාසල හෝ පත්වීම් විෂය කිසිදු හේතුවක් මත වෙනස් කරනු නොලැබේ.

7:3. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු / සමාදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු / පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු / දීප ව්‍යාප්ත සේවාවක නිලධාරියෙකු හෝ රු. 498,960/- ක් හෝ ඊට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ මාණ්ඩලික ශ්‍රේණියේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබිය යුතු ය.

7:4. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.11.13 දිනට හෝ ඊට පෙර **"ලේකම්, අධ්‍යාපන, තොරතුරු හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, නව නගරය, රත්නපුර"** යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් ගුරු පුරප්පාඩු (අ.පො.ස. (උ.පෙළ)) සඳහා අයදුම් කිරීම - 2023"** යනුවෙන් අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතු ය.

**8). විභාග පටිපාටිය :-**

8:1. මෙම නිවේදනයේ 1. හා 2.හි සඳහන් කොන්දේසිවලට අනුව සුදුසුකම් සපුරන ලද අපේක්ෂකයන්හට පමණක් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ බලය පවරනු ලබන වෙනත් ආයතනයක් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයා එහි තම අත්සන සහතික කරවා ගත යුතු අතර, විභාගයට පෙනී සිටින පළමු දිනයේ විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත සිය අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතු ය. එසේ ඉදිරිපත් නොකරන කිසිදු අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් හෝ බලය පවරනු ලබන වෙනත් ආයතනයක් මගින් හෝ සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් පළ කරනු ඇත.

8:2. අපේක්ෂකයෙකු තමන්හට නියම කරන ලද විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ බලය පවරනු ලබන වෙනත් ආයතනයක් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් අදාළ ආයතනය මගින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

8:3. විභාග මධ්‍යස්ථානයේදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය පමණක් බව සැලකිය යුතු ය.

8:4. මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍ය වලින් පමණක් පවත්වනු ලැබේ. විභාගයට අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

8:5. ඒ අනුව විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. ප්‍රශ්න පත්‍ර දෙකම බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලින් යුක්තය.

01. අභියෝග්‍යතා පරීක්ෂණය - කාලය පැය 01 යි (ලකුණු 100 යි)
අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා සහ තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත ය.

02. සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි (ලකුණු 100 යි)
ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා / හෝ දේශීය වශයෙන් සිදුවී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත ය.

8:6. මෙම ලිඛිත විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගෙන විෂයන් දෙකම සමත් විය යුතු ය. එසේ ලබා ගත් අයදුම්කරුවන්ගේ ප්‍රමුඛතා ලේඛනයක් සකස් කොට විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ බලය පවරනු ලබන වෙනත් ආයතනයක් විසින් සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබා දෙනු ඇත.

**9). විභාග ගාස්තු:-** විභාග ගාස්තුව රු. 1200/- කි. මෙම විභාග ගාස්තුව කිසිදු හෝ හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

i. සබරගමුව පළාත තුළ අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ අංක 20.03.02.99 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයදුම්පත්‍රයේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කර එවිය යුතු ය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත).

ii. දෙමළ මාධ්‍ය පුරප්පාඩු සඳහා දීපව්‍යාප්ත පදනමින් අයදුම් කරනු ලබන වෙනත් පළාත්වල අයදුම්කරුවන් **රත්නපුර ප්‍රධාන තැපැල් කාර්යාලයෙන් මුදල් මාරු කරගත හැකි වන පරිදි** ඕනෑම තැපැල් කාර්යාලයකින් **"ලේකම්, සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය"** නමින් මුදල් ගෙවා ලබාගන්නා ලද මුදල් ඇණවුම (Money Order) අයදුම්පත්‍රයේ නියමිත තීරුවේ අලවා එම ඇණවුම් අංකය සඳහන් කර එවිය යුතු ය. (මුදල් ඇණවුමේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත).

**10).** විභාග මධ්‍යස්ථාන :-

මෙම විභාගය පහත දැක්වෙන නගරවලදී පැවැත්වෙනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ බලය පවරනු ලබන වෙනත් ආයතනයක් විසින් පසුව දැනුම් දෙනු ඇත.

| නගරය | නගර අංකය |
|---|---|
| රත්නපුර | 01 |
| කෑගල්ල | 02 |

**11).** කිසියම් අයදුම්කරුවෙකු සුදුසුකම් සපුරා නොමැති බව පත්වීම් ලැබීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ අයදුම්පත කිසිදු හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද නියමිත සුදුසුකම් පිළිබඳව දැන දැනම හෝ ඕනෑකමින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු යටපත් කර ඇති බව හෝ පත්වීම් ලැබීමෙන් පසු අනාවරණය වුවහොත් හෝ පත්කිරීම සඳහා නුසුදුසු බව හෝ අනාවරණය වුවහොත්, වහාම රජයේ සේවයෙන් පහ කරනු / සේවය අවසන් කරනු ලැබේ.

**12).** උපලේඛන අංක Iහි දක්වා ඇති විෂය ක්ෂේත්‍රයන්ට අදාළව පමණක් මෙම නිවේදනය මගින් අයදුම්පත් කැඳවා ඇති අතර, එබැවින් මෙම නිවේදනයට අදාළව අයදුම්පතක් ඉදිරිපත් කිරීම, අදාළ තරඟ විභාගයට පෙනී සිටීම හෝ ඉන් සමත්වීම, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම හෝ ඊට ඉදිරිපත් වීම යන කිසිදු කරුණක් හෝ වෙනයම් ඕනෑම කරුණක් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ පත්වීමක් ලබා ගැනීම සඳහා වන අයිතිවාසිකමක් හෝ නීත්‍යානුකූල හිමිකමක් නොවන්නේ ය.

**13).** මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතු වන්නේ ය.

**14).** සිංහල හා දෙමළ භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**බී.ඒ.සී.පී. බමුණුආරච්චි,**
ලේකම්,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත.

2023.10.13 වන දින,
සබරගමුව පළාත් සභාවේ,
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේදී ය.